DOI: 10.31357/fhssmph.2014.00071

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ පශ්චාද් උපාධි පීඨයේ දර්ශනපති
උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

# ආතති කළමනාකරණයෙහි ලා බෞද්ධ විධික්‍රම පිළිබඳ අධ්‍යයනයක්

# A Study on Buddhist Methodologies in Stress Management



| | | |
|---|---|---|
| උපදේශකවරු | : | මහාචාර්ය ඥානදාස පෙරේරා මහතා |
| | : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය යාපාරත්න වීරසේකර මහතා |
| විෂය | : | දර්ශනය හා මනෝවිද්‍යාව |
| ලි.ප.අංකය | : | 1755/HU/2012/001 |
| නම | : | නෙල්ලිවල මෙත්තානන්ද හිමි |



06 AUG 2014

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ පශ්චාද් උපාධි පීඨයේ දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

# ආතති කළමනාකරණයෙහි ලා බෞද්ධ විධික්‍රම පිළිබඳ අධ්‍යයනයක්

# A Study on Buddhist Methodology in Stress Management

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය, අභ්‍යන්තර උපදේශක, මහාචාර්ය ඥානදාස පෙරේරා මහතා සහ ආචාර්ය යාපාරත්න වීරසේකර මහතාගේ උපදේශයෙන්, පුස්තකාල අධ්‍යයනය තුළින් දත්ත රැස් කිරීමෙන්, ම විසින් ස්වෝත්සාහයෙන් ම කරනු ලැබූවකි. මෙය මෙම විශ්වවිද්‍යාලයට හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට හෝ ඉදිරිපත් කළ නිබන්ධයක් හෝ නිබන්ධයක කොටසක් හෝ නොවන බවත් මෙහි අඩංගු සියලු කරුණු සඳහන් කිරීමකින් තොර ව ඇතුළත් කොට නැති බවත්, මාගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව වෙනත් කිසිදු කෙනකු විසින් මීට පෙර ලියන ලද හෝ මුද්‍රණය කරන ලද හෝ කිසි ම කරුණක් කෘතියෙහි නියමිත සඳහනකින් තොර ව ඇතුළත් කොට නොමැති බවත් මෙයින් සහතික කරමි.

මෙයට,

..............................

තෙල්ලිවල මෙත්තානන්ද හිමි

1755/HU/2012/001

# උපදේශකවරුන්ගේ නිර්දේශය

නෙල්ලිවෙල මෙත්තානන්ද හිමියන් විසින් **ආතති කළමනාකරණයෙහි ලා බෞද්ධ විධික්‍රම පිළිබඳ අධ්‍යයනයක්** යන මාතෘකාව යටතේ ලියා ඇති මෙම නිබන්ධය, දර්ශනපති උපාධිය සඳහා උචිත ලෙස සම්පාදනය කර ඇති බවත්, මෙය ඒ සඳහා සුදුසු බවත් නිර්දේශ කරමි.

01. උපදේශක :

..............................................................

(මහාචාර්ය ඥානදාස පෙරේරා)

02. උපදේශක :

..............................................................

(ආචාර්ය යාපාරත්න වීරසේකර)

# පිදුම

ශ්‍රී ලාංකේය මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රයට

ඉමහත් සේවාවක් සිදුකරන

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

දර්ශනය හා මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය

**ඥානදාස පෙරේරා ඇදුරුතුමන්ට**

# පටුන


| | |
|---|---|
| මාතෘකා පිටුව | |
| ප්‍රකාශය | iii |
| උපදේශකවරුන්ගේ නිර්දේශය | iv |
| පටුන | vi-xi |
| උපකාරානුස්මෘතිය | xii |
| සාර සංක්ෂේපය | xiii-xiv |
| හැකුළුම් | xv-xvii |
| **පළමුවෙනි පරිච්ඡේදය** | |
| **හැඳින්වීම** | 1-10 |
| 1.1 ප්‍රවේශය | 1-9 |
| 1.2 අරමුණු | 9-10 |
| 1.3 පර්යේෂණ ක්‍රමවේදය | 10 |
| **දෙවෙනි පරිච්ඡේදය** | |
| **ආතතිය පිළිබඳ අපරදිග සහ බෞද්ධ නිර්වචනයන් අධ්‍යයනය කිරීම** | 11-36 |
| 2.1 ආතතිය පිළිබඳ බටහිර නිර්වචන | 11-15 |
| 2.2 ආතතිය පිළිබඳ බෞද්ධ නිර්වචන | 16-25 |
| 2.2.1 දුක්ඛ | 16-18 |
| 2.2.2 දෝමනස්ස | 18 |
| 2.2.3 උපායාස | 19 |
| 2.2.4 සෝක | 19 |
| 2.2.5 පරිදේව | 19-20 |
| 2.2.6 සංතාප | 20-21 |
| 2.2.7 පීළන | 21 |

2.2.8 දරථ 21-22

2.2.9 විඝාත 22

2.2.10 මනස හා මතු සංකල්ප අතර අන්‍යොන්‍ය සම්බන්ධය 22-24

2.2.11 බෞද්ධ පාරිභාෂික පද ස්ථරායනය 24-25

2.3 ආතතිය වර්ගීකරණය 25-26

2.4 පුද්ගලයා හා මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය 26-28

2.5 ආතතිය සඳහා බලපාන සාධක පිළිබඳ බෞද්ධ විග්‍රහය 28

2.5.1 සියල්ල මානසික සාධක මත රඳෙන බව 29-34

2.6 ආතතිය බාහිරට ප්‍රකට වීම බෞද්ධ මූලාශ්‍රයෙන් 34-36

**තෙවෙනි පරිච්ඡේදය**

**ආතතිය කළමනාකරණයට බෞද්ධ දර්ශනාගත විවිධ ක්‍රමවේද** 37-62

3.1 ආතතිය කළමනාකරණය කළ යුක්තක් ද බැහැර කළ යුක්තක් ද 37-42

3.1.1 කළමනාකරණයේ වපසරිය 37-38

3.1.2 ආතතිය කළමනාකරණය කළ නොහැක්කේ ඇයි 38-41

3.1.3 ආතතිය විශෝධනය 41-42

3.2 බෞද්ධ ආතති විශෝධන ක්‍රම 42-61

3.2.1 පටිච්චසමුත්පාද ධර්මය හා ආතතිය විශෝධනය 42-45

3.2.2 ත්‍රිලක්ෂණ ධර්මය හා ආතතිය විශෝධනය 45-46

3.2.3 චතුරාර්ය සත්‍ය සහ ආතතිය විශෝධනය 46-48

3.2.4 මධ්‍යම ප්‍රතිපදාව සහ ආතතිය විශෝධනය 48-49

3.2.5 ස්කන්ධ, ධාතු, ආයතන විග්‍රහය සහ ආතතිය විශෝධනය 49-50

3.2.6 අෂ්ට ලෝක ධර්මතා මගින් ආතතිය විශෝධනය 50-52

3.2.7 අප්පිච්ඡතා හා සන්තුට්ඨිතා න්‍යාය තුළින් ආතතිය විශෝධනය 52-53

3.2.8 බෞද්ධ දාර්ශනික පරමාර්ථ තුළින් ආතතිය විශෝධනය 54-61

## සිව්වෙනි පරිච්ඡේදය


**ආතතිය කළමනාකරණය සඳහා බෞද්ධ භාවනා ක්‍රම හඳුනාගැනීම** 62-88

4.1 සමථ භාවනාව හා විදර්ශනා භාවනාව 63-84

4.1.1 බුදුදහමේ මූලික අභිප්‍රේතාර්ථය 63-64

4.1.2 භාවනාව යනු කුමක්ද 65-66

4.1.3 සමථ භාවනාවේ ස්වභාවය හා උපයෝගීතාව 66-67

4.1.4 නීවරණ ධර්මතා යටපත් කිරීම 67-72

4.1.4.1 කාමච්ඡන්දය 68

4.1.4.2 ව්‍යාපාදය 69

4.1.4.3 ථීනමිද්ධය 69

4.1.4.4 උද්ධච්ච - කුක්කුච්ච 70

4.1.4.5 විචිකිච්ඡා 70-72

4.1.5 භාවනා සඳහා පූර්ව අවබෝධය 72-79

4.1.5.1 ඡබ්බිද චරිත ලක්ඛණ 72

4.1.5.1.1 රාග චරිත 72-73

4.1.5.1.2 දෝෂ චරිත 73

4.1.5.1.3 මෝහ චරිත 73

4.1.5.1.4 සද්ධා චරිත 74

4.1.5.1.5 බුද්ධි චරිත 74

4.1.5.1.6 විතර්ක චරිත 74-75

4.1.5.2 සීලය හෙවත් කය වචනයෙහි සංවරය 75-79

4.1.6 නූතන ලෝකයේ සමථ භාවනාවේ උපයෝගීතාව 80-84

4.1.6.1 අපරදිග 80

4.1.6.2 පෙරදිග 80

4.1.6.2.1 මෛත්‍රී භාවනාව 80-82

4.1.6.2.2 බුද්ධානුස්සති භාවනාව 82

4.1.6.2.3 ආනාපානසති භාවනාව 83-84

4.2 විදර්ශනා භාවනාව හා ආතති කළමනාකරණයට එහි ඇති වැදගත්කම 84-88

**පස්වෙනි පරිච්ඡේදය**


**පුරාතන බෞද්ධ සාහිත්‍යයෙහි එන ආතති කළමනාකරණය** 89-109

5.1 ප්‍රවේශය 89

5.2 රසභාව පදනම් කරගත් ආතති කළමනාකරණය 90

5.3 ග්‍රන්ථ චිකිත්සාව 90-95

5.4 බෝධිසත්ත්ව චරිතාදර්ශය 95-97

5.5 කාරුණික වචන භාවිතය 97-98

5.6 භාව ප්‍රකාශනය (නිදහස් සංසථනය) 99-100

5.7 ධනාත්මක චින්තනය 100-101

5.8 භෞතික හා ආධ්‍යාත්මික එළඹුම 101-102

5.9 ධර්මානුකූල ජීවන සැකැස්ම 102-103

5.10 උපදේශනය 103-105

5.11 ප්‍රජානන ප්‍රතිකාරය 105-107

5.12 ශ්‍රැතිය හෙවත් ශ්‍රවණය 107-109

5.13 සත්‍යක්‍රියාව 109-110


**සයවෙනි පරිච්ඡේදය**


**බෞද්ධ අභිචාර විධීන්හි ප්‍රකට වන මනෝවිද්‍යාත්මක ප්‍රවණතා** 111-128

6.1 අභිචාර නිර්වචනය 111-113

6.2 මුල් බුදුසමයෙන් ප්‍රකට වන අභිචාර 113-117

6.3 ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය තුළ ගැබ් වී ඇති අභිචාර හා ඒවායේ මනෝවිද්‍යාත්මක ප්‍රවණතා 118-125

6.3.1 බෝධි පූජාව 118-121

6.3.2 පිරිත 121-123

6.3.3 බෞද්ධ ශුද්ධ පාඨ 123-125

6.4 අබෞද්ධ අභිචාරවිධිවල බෞද්ධ ආභාසය හා ඒවායේ මනෝවිද්‍යාත්මක ලක්ෂණ 125-126

6.4.1 කිරි අම්මාවරු දානය 126

6.4.2 බලි පූජාව 127

6.4.3 බෞද්ධ අභිචාරාත්මක උපකරණ 127-128

**සත්වෙනි පරිච්ඡේදය**

**යහපැවැත්ම පිළිබඳ බෞද්ධ සංකල්ප තුළින් ආතතිය කළමනාකරණය** 129-158

7.1 සාධු චරණය හෙවත් නිවැරදි හැසිරීම 129-158

7.1.1 සීලය 130-138

7.1.1.1 පරපණ නැසීමෙන් වැළකීම 132-133

7.1.1.2 අදින්නාදානය හෙවත් සොරකමෙන් වැළකීම 134-135

7.1.1.3 කාම මිථ්‍යාචාරයෙන් වැළකීම 135-136

7.1.1.4 මුසාවාදයෙන් වැළකීම 136

7.1.1.5 රහමෙර පානයෙන් වැළකීම 137-138

7.1.2 ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා 138-139

7.1.3 සමාජ ඇගයුම් 140-141

7.1.4 ධර්ම ශ්‍රවණය හා ධර්ම සාකච්ඡාව 141-142

7.1.5 ආර්ථික පදනම මත නිර්මාණය වන යහ පැවැත්ම 143-149

7.1.6 නිවැරදි සමාජ සම්බන්ධතා 149-150

7.1.7 මෛත්‍රිය සංකල්පය 151-152

7.1.8 සතර බ්‍රහ්ම විහරණය 152-154

7.1.9 සතර සංග්‍රහ වස්තු 154-155

7.1.10 සතර අගතියෙන් බැහැර වීම 155-156

7.1.11 බෝධිසත්ත්ව සංකල්පය 156-158

**අටවෙනි පරිච්ඡේදය**

**නිගමනය** 159-162

**ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය** 163-174

ප්‍රාථමික මූලාශ්‍රය 163-164

ද්විතීයික මූලාශ්‍රය 165-169

Secondary Sources (English) 169-174

ශබ්ද කෝෂ හා විශ්ව කෝෂ 174

Web Sites 174

ඇමුණුම් 01 බෝධි පූජා කවි 175-176

ඇමුණුම් 02 පිරිත්වලින් කරන ශාන්ති කර්ම 176-196

ඇමුණුම් 03 පිරිත් හා සම්බන්ධ යන්ත්‍ර 197-207

**ඡායාරූපාවලිය** 208-214

අංක 01 බෝධි පූජාවක ඡායාරූප 208

අංක 02 බෝධි පූජාවක ඡායාරූප 208

අංක 03 ගොක් කොළ යොදා සකස් කළ පිරිත් මණ්ඩපය 209

අංක 04 කඩදාසිවලින් සකස් කළ පිරිත් මණ්ඩපයක් 209

අංක 05 ලීවලින් සකස් කළ පිරිත් මණ්ඩපය 210

අංක 06 පිරිතට ධාතු කරඬුව වැඩමවීම 210

අංක 07 සූනියම් යාගය 211

අංක 08 ගරායක් ශාන්තිය 211

අංක 09 ශාන්ති කර්මයකදී ආතුරයා නිරූපිත අවස්ථාවක් 22

අංක 10 ශාන්ති කර්මයක අවස්ථාවක් 212

අංක 11 ශාන්ති කර්මයක අවස්ථාවක් 213

අංක 12 බලි යාගයේ අවස්ථාවක් 213

අංක 13 බලි යාගයේ අවස්ථාවක් 214

# උපකාරානුස්මෘතිය

මෙම පර්යේෂණ නිබන්ධය ලිවීමේ දී සත්පුරුෂ බොහෝ පිරිසක් මා හට උදව් උපකාර කරන්නට යෙදුණි. ඒ අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශාධිපති මහාචාර්ය මාගම්මන පඤ්ඤානන්ද නායක හිමියන් ඇතුළු අධ්‍යයනාංශයේ සියලු ම කථිකාචාර්ය ස්වාමීන් වහන්සේලා ද, එසේ ම මෙම නිබන්ධයේ අභ්‍යන්තර උපදේශකවරු ලෙස කටයුතු කළ නිරන්තරයෙන් ම මාගේ අධ්‍යාපනික පර්යේෂණ සඳහා උපදෙස් සපයන මහාචාර්ය ඥානදාස පෙරේරා ඇදුරුතුමාටත්, ආචාර්ය යාපාරත්න වීරසේකර ඇදුරුතුමාටත් මූලික ගෞරවය හිමිවිය යුතුය. එසේ ම මෙහි මුල් සම්මන්ත්‍රණ පත්‍රිකාවන්හි දී සුපරීක්ෂක ලෙස කටයුතු කර වරද නිවරද කරමින් මා හට මගපෙන්වූ කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දයා එදිරිසිංහ මහතාටත්, මෙවැනි කාර්යයන් සඳහා සැමදා උපදෙස් දෙන අප අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ඒ වීරසේන මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අරුණ ශාන්ත වල්පොල ඇදුරුතුමා ඇතුළු සියලු ආචාර්ය මණ්ඩලයටත් මාගේ ගෞරවය පුද කරමි. එමෙන් ම මාහට සියලු නිදහස දෙමින් ඉගෙනුම සඳහා උනන්දු කරවන මාගේ සහෝදර රංවල සුමනානන්ද හිමි, හුණුවල සද්ධානන්ද හිමි යන පැවිදි සහෝදර දෙපලටත් මාගේ ආදරණීය අම්මාටත්, අද ජීවත් ව නැතිමුත් දරු සෙනෙහසින් මා පෝෂණය කළ රිල්හේන ශ්‍රී අභයවර්ධනාරාමාධිපති ගුරුදේවෝත්තම නායක මාහිමියවත් ආදරණීය තාත්තාවත් කෙසේ නම් අමතක කරන්නද? එමෙන් ම විෂය කරුණුවල ගැටලු ඇති වූ සෑම අවස්ථාවකදී ම අවශ්‍ය දැනුම සඳහා උපකාර කළ සැබෑම මිතුරන් වන බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ආචාර්ය විතාරන්දෙණියේ චන්ද්‍රසිරි හිමියනුත් තායිලන්තයේ මහිදෝල් විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ආචාර්ය විජිත කුමාර මහතාටත් භාෂාමය ගැටලු ඇති වූ විට එය නිවැරදි කරදුන් උලහිටියාවේ විහාවි හිමියන් හා වැල්ලෙතොට ඉන්ද්‍රානන්ද හිමියන් ඇතුළු උදව් කළ සැමටත් හෘදයාංගම කෘතඥතාව පුදකරමි.

නෙල්ලිවල මෙත්තානන්ද හිමි

# සාරසංක්ෂේපය

මනෝවිද්‍යාව නූතන අධ්‍යයන ක්ෂේත්‍රයෙහි ඉතා විශේෂ ස්ථානයක් හිමි කරගෙන තිබෙන්නේ එහි ඇති දාර්ශනික හරයත් ප්‍රායෝගික අගයත් අනෙකුත් සියලු විෂය සංධාරයන් අභිභවා සිටින නිසාය. කෙසේ වුවත් මෙම මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් වපසරියක ව්‍යාප්ත වී ඇති අතර ආතති කළමනාකරණය යනු එවැනි ප්‍රශාඛාවලින් එක් අංශයක් පමණි. අපගේ ප්‍රස්තුතය වන ආතති කළමනාකරණය මෙන් ම සමස්ත මනෝවිද්‍යාව ම බුදුදහම සමග අතිශය සමීපත්වයක් උසුළන්නේ බුදුදහමේ මූලික ඉගැන්වීම් මෙන් ම ආවසානික පරමාර්ථය ද මනෝමූලික පදනමක යැපෙන බැවිනි. මෙම පර්යේෂණයෙහි දී අපගේ මූලික අවධානය යොමු වූයේ මනෝවිද්‍යාත්මක පදනමක් සහිත බෞද්ධ ඉගැන්වීම් තුළ ආතතිය කළමනාකරණය විෂයයෙහි කෙබඳු සම්බන්ධතාවක් උසුලන්නේ දැයි විමර්ශනය කිරීමටයි. මනෝවිද්‍යාව තනි විෂයයක් වශයෙන් බටහිර සමාජයෙන් මතු වී ආ බව අවිවාදයෙන් පිළිගත යුතුය. එසේ වුවත් එය බටහිර ඥානයෙන් ම යැපිය යුතු යැයි අපි නො සිතමු. බටහිර සමාජයෙන් නැගී ආ මනෝවිද්‍යා විෂය පෙරදිග ඥානයෙන් ප්‍රතිපෝෂණය කොට ශක්තිමත් කිරීම අපගේ මූලික අරමුණ විණි. ඒ සඳහා විෂය සීමාව වශයෙන් ආතති කළමනාකරණය පිළිබඳ ව විමර්ශනය කෙරේ.

ප්‍රධාන වශයෙන් ම බටහිර දී භාවිත කරන ආතති කළමනාකරණය (Stress Management) යන්න කොතරම් දුරකට උචිතදැයි යන්න පැහැදිලි කරගැනීමට කටයුතු කළෙමු. එහිදී අපගේ පැහැදිලි කරගැනීම වූයේ බුදුදහම කළමනාකරණය කිරීමකට එහා ගිය සම්පූර්ණ බැහැර කිරීමේ ක්‍රියාවලියක් හඳුන්වාදී ඇති බැවින් බෞද්ධ සංදර්භය හමුවේ කළමනාකරණයට වඩා වැදගත් ම ව්‍යවහාරය වන්නේ විශෝධනය යන්න බවයි. මීට අමතර ව බෞද්ධ දාර්ශනික හා ප්‍රායෝගික එළඹුම් හරහා ආතතිය හඳුනාගැනීමේ ක්‍රමවේදයන් ද ඒවා වර්ගීකරණය කිරීම ද මෙහි දී සිදු කරනු ලැබූ අතර අතිශය වැදගත් ම පර්යේෂිත කරුණු වශයෙන් සැලකීමට බඳුන් වූයේ ආතති කළමනාකරණය කෙරෙන ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයයි. එහිදී විශේෂයෙන් ම ප්‍රජානන ක්‍රමවේදය ඇතුළු විශේෂ විධි කිහිපයක් මෙහි සාකච්ඡාවට බඳුන් විය. මෙම පර්යේෂණයෙන් මුල් බුදුදහමට පමණක් නොව පශ්චාත් බෞද්ධ සංස්කෘතික ලක්ෂණ කෙරෙහි ද අවධානය යොමු වූ අතර බෞද්ධ සාහිත්‍ය අධ්‍යයනය තුළින් සිදුවන ආතති

කළමනාකරණයත්, බෞද්ධ අභිචාර මගින් සිදුවන ආතති කළමනාකරණයත්, සමථ හා විදර්ශනා භාවනා මගින් සිදු කළ හැකි ආතති කළමනාකරණයත්, මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රයට නව ආලෝකයක් ලබා දෙන බව අපගේ පරම විශ්වාසයයි.

# හැකුළුම්

## ප්‍රාථමික මූලාශ්‍ර

| | |
|---|---|
| අංනි | - අංගුත්තරනිකාය |
| අංනිඅ | - අංගුත්තරනිකාය අට්ඨකථා |
| අභිධම්මත්ථ | - අභිධම්මත්ථ සංගහ |
| අභිධමාති | - අභිධම්ම මාතික |
| ඉතිඅ | - ඉතිවුත්ත අට්ඨකථා |
| උදා | - උදාන පාළි |
| ඛුනි | - ඛුද්දකනිකාය |
| ඛුද්පාඅ | - ඛුද්දකපාඨ අට්ඨකථා |
| චූනි | - චූල්ලනිද්දේස |
| ජා | - ජාතක පාළි |
| ජාඅ | - ජාතක අට්ඨකථා |
| ථෙර | - ථෙරගාථා පාළි |
| ථෙරඅ | - ථෙරගාථා අට්ඨකථා |
| ථෙරී | - ථෙරී ගාථා පාළි |
| ථෙරීඅ | - ථෙරීගාථා අට්ඨකථා |
| දීනි | - දීඝනිකාය |
| දීනිඅ | - දීඝනිකාය අට්ඨකථා |
| දීනිටී | - දීඝනිකාය ටීකා |
| ධම්මසං | - ධම්මසංඝණී |
| ධප | - ධම්මපද පාළි |
| ධපඅ | - ධම්මපද අට්ඨකථා |
| නෙත්ති | - නෙත්තිප්පකරණ |
| නෙත්තිඅ | - නෙත්තිප්පකරණ අට්ඨකථා |
| පජාපො | - පන්සිය පනස් ජාතක පොත් වහන්සේ |
| පටිසම්අ | - පටිසම්භිදාමග්ග අට්ඨකථා |